# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි

VOLUME 11
NUMBER 04

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

JULY 10, 2008 ජූලි මාසය (බුද්ධ වර්ෂ 2552 ඇසළ මාසය)


# ආයිත් පරිප්පු?

**සංජය විමලරත්න විසිනි**

**පරිප්පු වනාහි ලාංකික කාගේත් ඉතා ජනප්‍රිය ආහාරයකි. විවිධ පරිප්පු වර්ග ඇත. කඩල, මුං, මයිසූර් ආදී වශයෙනි. පරිප්පු නැති වුවහොත් බොහෝ අයට ආහාර වේල සම්පූර්ණ නැත.**

එසේම **හොඳ පරිප්පුවක් කෑවා** ය යන යෙදුමද අපේ ජන වහරට මෑතකදී එකතුවූ කියමනකි. යම් අවස්ථාවකදී අමිහිරි අත්දැකීමක් ලැබීම වැඩි විස්තර නොකර කෙටියෙන් කියන්නේ එසේය. එසේම යම් අයෙකු අනවශ්‍ය ලෙස යම් දෙයකට පැන ඉදිරිපත්වී ඉන් අපහසුතාවකට මුහුණ පෑවහොත් එය ද **ඉල්ලං පරිප්පු කෑමක්** ලෙස අපේ තරුණ පෙළ හඳුන්වති.

දැනට වසර විස්සකට පමණ පෙර **1989** දී අප රටේ පැවතෙනවායයි සැලකෙන වර්ගවාදී ගැටුමට ඉන්දියාව අත පොවන්නට කළ වෑයමකදී පොවන්නට තැත්කරන බවක් පෙනේ. දෙසතියකට පමණ පෙර ඉන්දියානු රජයේ ඉහළම මට්ටමේ නිලධාරීන් තිදෙනෙක් පැය **36** කට හදිසියේ ලංකාවට පැමිණ ලංකා රජයේ ඉහළ අයත්, ඊනියා වර්ගවාදී ගැටුම් වලට සම්බන්ධිතයයි ඉන්දියාව සලකන මෙහි සමහර පුද්ගලයිනුත් හමුවී කසු කුසු ගා සාකච්ඡාකොට ගියේ නිකම් නොවේ. දැන් ක්‍රමයෙන් මේ කරුණ ගැන ප්‍රවෘත්ති පිටවෙමින් පවතී.

විසි අවුරුද්දක අත්දැකීම් සමග අප රට ද, රජය සහ ජනතාව ද, එදා වර්ගවාදී ගැටුම් ලෙස හැඳින්වූ තත්වයන්ද ආදී මේ සියල්ල වෙනස්වී



**රජීව් ගාන්ධි ලංකාවට ආ ප්‍රථම සහ එකම වතාවයි මේ**

ඉන්දියානු බලධාරීන් ලංකාණ්ඩුවෙන් අවසරයක් නැතිව ගුවනින් අවුත් බලයෙන් අප රටේ උතුරුකරයේ ජන යාට ඇත්තටම ගුවනින් පරිප්පු දැමී-මෙන් අපට **බලෙන් පරිප්පු කවන් නට** හැදූ ආකාරයත්, එම ක්‍රියාව දෙරට අතරේ මතභේදයකට තුඩුදී මෙන් සිදුවූ දේවලුත් දැනට වැඩිහිටි බොහෝ අයට මතක ඇතැයි සිතමු. අන්තිමේදී එයට සම්බන්ධ වූ කවුරුත් **පරිප්පු කෑමෙන්** එම ක්‍රියා වලිය අව සන්වූ ආකාරයද කාටත් මතක ඇත. නොදන්නා අයට ඒ ගැන වාර්තාගත දේ කියවා දැනගත හැකි ය.

දැන් සති කීපයක සිට අප රටේ ප්‍රශ්න වලට ඉන්දියාව නැවත අත ඇත. එදා සංකීර්ණ යයි සැලකුණු ඊනියා වර්ගවාදී ගැටුම අද ප්‍රධාන වශයෙන් ත්‍රස්තවාදී සුළු කණ්ඩායමක් විනාශ කරලීමේ කාර්යය අවසන් කරලීම දක්වා සරල වී ඇත.

*මේ වෙනස් වී ඇති පසුබිම යටතේ ඉන්දියාව නැවත අත දැමීමේ ප්‍රයත්නයක්ද? එසේ නම් ඒ ඇයිද? අද අප රට මේ බලපෑම් ගැන ගන්නා ස්ථාවරය කුමක් විය යුතුද? යන්න ගැන විමසුමක් කිරීම මේ ලිපියේ අරමුණ වෙයි.*

**ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website**
**http://www. lankaheritage.com/lankaviththi/**

*මිහි මඩලේ අඳුරු කුසේ දිය උල්පත අම්මා . . . . . . . .*



*මේ පින්තූරය ගත් ඡායාරූප ශිල්පියා කවුරුදැයි නොදනිමු. කවරෙකු හෝ වේවා ඔහුට අපගේ ස්තූතිය හිමිවේ.*

## ත්‍රස්තවාදයට හමුදාමය විසඳුමක් තිබේ. *There is a Military Solution to terror.*

අද මුළු ලොවම මුහුණ දී ඇති ප්‍රධානම ව්‍යසනය නම් විවිධ ස්වරූප වලින් මතුවී ඇති ත්‍රස්තවාදයයි. ඇමරිකාව ප්‍රධාන බටහිර රටවල් අල්කයිඩා තලෙයිබාන් සහ මුස්ලිම් මූලධර්මවාදී ත්‍රස්තවාදීන්ට විරුද්ධව ද, අප වැනි රටවල් කොටි ත්‍රස්තවාදීන්ට විරුද්ධවද කරනුයේ මේ එකම සටනයි.

දේශපාලන විසඳුමකින් මිස යුදමය වශයෙන් ත්‍රස්තවාදය බිඳලිය නොහැකිය යනු කාලයක් තිස්සේ මුල් බැස ගෙන ඇති දුර්මතයකි. මේ දුර්මතය බිඳවැටෙමින් පවතින ආකාරය ගැන මෙහි ඉහත දැක්වූ ශීර්ෂ පාඨය යටතේ වටිනා ලිපියක් ලොව පිළිගත් **The Wall Street Journal** නමැති ඇමරිකානු සඟරාවේ මේ ජූනි මස මුල පිටවූ කලාපයක පළවිය. එය සැකෙවින් මෙසේ ය.

"ඉරාකයේ බැග්ඩෑඩ් නගරය, ශ්‍රීලංකාවේ උතුරු නැගෙණහිර ප්‍රදේශ, දකුණු ඇමරිකාවේ කොලොම්බියා රටේ ග්වාවියාරේ (Guaviare) ප්‍රදේශය, යන ඒවා ලෝකයේ විවිධ තැන්වල විවිධ ලක්ෂණ වලින් යුතු ප්‍රදේශ වෙති. නමුත් මේ තුන් පොලේම අද පොදු ලක්ෂණය වනුයේ දීර්ඝ කාලයක් ගෙන ගිය ත්‍රස්ත විරෝධී සටන් සාර්ථක ලෙස අවසානයකට ගෙන ඒමට ළංව සිටීමයි.

මේ මැයි මාසය තුළ ඉරාකයේ ත්‍රස්ත වාදීන් විසින් ඇති කරනු ලැබූයේ සිද්ධීන් 300 ක් පමණි. මෙය පසුගිය එනම් 2007 මැයි තුළ එවැනි සිද්ධීන් සංඛ්‍යාව වූ 1600 සිට ශීඝ්‍රයෙන් පහත වැටීමකි. 2004 ට පසු සිදු කළ අඩුම සිද්ධීන් සංඛ්‍යාව මේ වසරේ එම සංඛ්‍යාවයි. ඉරාක රජයේ හමුදා, එක් සත් ජනපදයේ හමුදාවල සහ සුන්නි ගෝත්‍රික කණ්ඩායම් වල ද සහාය ඇතිව අල්කයිඩා ත්‍රස්තවාදීන් සුන්කර ඇත. Sadr සාඩර් ප්‍රදේශයේ බලවතුන් ලෙස සිටි, ශියායිට් ගෝත්‍රිකයින් අල්ලා ගෙන සිටි සාඩර් නගරයෙන් එම ත්‍රස්තවාදීන් පළවා හැර ඇත.

කොළොම්බියාවේ වසර 44 ක් තුළ එම රජයට විරුද්ධව ත්‍රස්ත සටනක් මෙහෙයවූ **FARC** පාක් ගරිල්ලා ව්‍යාපාරය අද පහතටම වැටී ඇත. එම ගරිල්ලා නායකයින් තිදෙනෙක්ම මාර්තු වලදී මරාදමන ලද අතර රජයට හා සිවිල් ප්‍රදේශවලට එරෙහිව දෙන ප්‍රහාර පැවති මට්ටමෙන් **1/3** කට බැස ඇත. මේවා කොළොම්බියා රජයේ හමුදා වඩා හොඳ පුහුණුව සහ ආයුධ සහිතව ගෙන යන ප්‍රහාරවල ප්‍රතිඵල වෙති. දීර්ඝ කාලයක් අයෝමය සංවිධානයකුත් දේශපාලන දර්ශනය කුත් යුතුව ප්‍රබලව සිටි **FARC** සංවිධානයෙන් සාමාජිකයෝ බුරුතු පිටින් හැර යති. සංවිධානය සහ ප්‍රහාරක ශක්තිය බිඳවැටී ඇත.

ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ රජයේ හමුදා මගින් ගෙන ගිය ප්‍රහාර නිසා උතුරු නැගෙණහිර ප්‍රදේශවල දිස්ත්‍රික් 9 යකම

**5 වෙනි පිටුව බලන්න →**

**දරුවන් විසිර ගොස් ඇත නෙක් දුරු රටක**
**නැත උන් දැකගැන්ම දැන් සිහිනෙන් මිසක**
**දිවියෙහි අග සිටින මුත් ඇති එකම දුක**
**යන්නට වෙද දිනක උන් කිසිවෙකු නොදැක**

**The Children have gone to far away lands**
**In my dreams only I see them now**
**Having reached my end, only one thing to grieve**
**That I might not see them, the day I leave**

♦ *දයා ආනන්ද රණසිංහ Daya Ananda Ranasinghe*




ලොවපුරා මුදල් යැවීම සඳහා
එකම විශ්වාසවන්ත නාමය

MCG FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3